ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2369/05 - 2024 ජනවාරි මස 29 වැනි සඳුදා - 2024.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DIVUD/LND/ACQUI/13/6-2
DIVUD/LND/ACQUI/WTR/16.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/18/2020/WS/240.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවන් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1504, ඉහළගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉහළගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද කැ.සි. 421361 කලාප 02, පත්‍ර 1 දක්වා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 3ක් වේ.

උපලේඛනය

**කැබලි අංක 1**

ඉඩමේ නම: මීගහමුලවත්ත *හෙවත්* සියඹලාගහමුලවත්ත, කෝන්ගහමුලහේන; හිමිකම් කියන අය: ආර්. පී. ඉන්ද්‍රා පද්මලතා, නාත්තන්ඩිය පාර, උඩුබද්දාව; ප්‍රමාණය: හෙක්. 0.0502.

**කැබලි අංක 2**

ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය, ඇළ; ප්‍රමාණය: හෙක්. 0.0042.

**කැබලි අංක 3**

ඉඩමේ නම: කෝන්ගහමුලහේන; හිමිකම් කියන අය: ආර්. පී. ඉන්ද්‍රා පද්මලතා, නාත්තන්ඩිය පාර, උඩුබද්දාව; ප්‍රමාණය: හෙක්. 0.0215.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.03.13 වැනි දින පෙ.ව. 10.00 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2024.03.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**නිලූකා ඩී. දසනායක,**
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2024 ජනවාරි මස 26 දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0222

1A - G 041322 - 09 (2024/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*